කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර

வலயக் கல்வி காரியாலயம் கொழும்பு - ஸ்ரீ ஜயவர்த்தனபுரம்

Zonal Education Office Colombo - Sri Jayawardhanapura

දෙවන වාර පරීක්ෂණය - 2025

இரண்டாம் தவணைப் பரீட்சை - 2025

Second Term Test - 2025

# 11 ශ්‍රේණිය - ඉතිහාසය

**II පත්‍රය** කාලය : පැය 03

උපදෙස් :

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- IIකොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6කි.

## I කොටස

01.

(අ) පහත (I) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

I. යාපනය, ඉරණමඩු වැව, කෝනේෂ්වරම් කෝවිල, පුත්තලම, අනුරාධපුරය, කලා වැව, මඩකලපුව, දැදුරු ඔය, මහනුවර, මිනිහා ගල් කන්ද, මාතර, පරාක්‍රම සමුද්‍රය (ලකුණු 12)

II. කල්කටා, බ්‍රිතාන්‍ය, රතු මුහුද, බෙංගාල බොක්ක, ඉතාලිය, බතාවිය ( ලකුණු 06 )

(ආ)

I. පහත A, B,C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්/ ස්ථානවලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. දඹුල්ලේ පිහිටි පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමිය නම් කරන්න.


B. සටන් ව්‍යාපාරයක් මගින් චෝල පාලකයන් පරදා රට එක්සේසත් කොට පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කර ගත් රජතුමා නම් කරන්න.

C. උඩරට ප්‍රදේශ ආශ්‍රිතව මුල්වරට ස්වාධීන රාජ්‍යයක් ගොඩනැගූ පාලකයා නම් කරන්න.

D. ක්‍රි.ව. 1602 දී පළමු වන විමලධර්මසූරිය රජතුමා හමු වූ ලන්දේසි දූතයාගේ නම ලියන්න. (ලකුණු 1 × 4)

II. A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A රූපය



1. මෙහි දැක්වෙන සථූපය නම් කරන්න?
2. මෙම ස්තූපය පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?
3. මෙම ස්තූපය කරවූ රජතුමා නම් කරන්න.
4. මෙම සථූපය වටා පවතින ගල් කණු මත ඉදි කළ නිර්මාණය කුමක් ද?

( ලකුණු 1 × 4)



Scanned with CamScanner

B රූපය



III.

1. මෙම B රූපයේ සිටින රජතුමාගේ නම ලියන්න. ශ්‍රී වික්‍රම
2. රජ වීමට පෙර ඔහු භාවිත කළ නම කුමක්ද? කන්නසාමි
3. මොහු හට රජ බවට පත් වීමට උදව් කළ රදල නායකයා නම් කරන්න. පිළිමතලව්වේ
4. මෙතුමාව අත්අඩංගුවට ගත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. රොබට් බ්‍රවුන්රිග් (ලකුණු 1 × 4)

---

## II කොටස

---

02.

I. A - ශ්‍රී ලංකාව ජනාවාස කළ මුල්ම මානවයා හඳුන්වන නම ලියන්න
   B - ඔවුන් ජීවත් වූ පරිසර කලාප දෙකක් ලියන්න (ලකුණු 3)

II. ප්‍රාග් ඓතිහාසික යුගයේ මෙරට පැවැති ජනාවාස හතරක් නම් කරන්න. (ලකුණු 4)

III. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි දෙකක් නම් කොට, එම යුගයේ පැවැති අභිචාර පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. මුල් ඓතිහාසික යුගයේ මෙරට සිටි මානවයන්ගේ ජීවන රටාව කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

03.

I. පහත දැක්වෙන තනතුරු නාම පූර්ව රාජ්‍ය සමයේ දී හැඳින්වූ ආකාරය අනුපිළිවෙලින් ලියා දක්වන්න.
   A- පවුලක ප්‍රධානියා
   B- ගමක පාලකයා
   C- ප්‍රදේශයක ප්‍රධානියා (ලකුණු 3)

II. පැරණි සමාජයේ ගමිකයන් විසින් ඉටු කළ කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 4)

III. මෙරට රාජ්‍ය උරුමය පැවරුණු ආකාර දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. පළමුවන විජයබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස හැඳින්වීම සාධක තුනක් යටතේ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

04.

I. ඕනෑම රටක පාලනය මෙහෙයවන ප්‍රධාන ආයතන තුනක් පවතී. එම ආයතන තුන නම් කරන්න. (ලකුණු 3)

II. A - ගැබිණි මව්වරුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් මාතෘ නිවාස ඉදිකළ රජතුමා නම් කරන්න.

B - පළමු වන ගජබාහු රජතුමා පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට සහභාගි වීම සඳහා ගිය රාජ්‍ය නම් කරන්න.

C - අප රටෙහි දේශපාලන බලය ස්ථාවර පවත්වාගෙන යාම සඳහා තිලෝක සුන්දරි නම් කාලිංග වංශික කුමාරිකාව විවාහ කරගත් පාලකයා නම් කරන්න.

D - යකඩ වැඩ කළ කම්මල්කරුවන් සෙල්ලිපිවල හඳුන්වා ඇති නම කුමක්ද? (ලකුණු 4)

III. පහත සඳහන් පැරණි සමාජයේ භාවිත කළ වචනවලින්, හඳුන්වන ලද්දේ කුමක්දැයි/ කවුරුන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

A. එක්තැන් සමිය
B. වත් හිමි
C. මහලේ
D. දසගම් ඇත්තන්
E. වෙජ්ජශාලා

(ලකුණු 5)

IV. මෙරට පැරණි සමාජය තුළ විසූ ජනතාව අතර ආගමික සහජීවනයක් පැවති බව උදාහරණ තුනක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)



Scanned with CamScanner

05.

I. මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිත කළ නම් තුනක් කරන්න (ලකුණු 3)

II. පළමු වන විමලධර්මසූරිය රජතුමා බලයට පත්වීමේ දී මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න (ලකුණු 4)

III. මහනුවර රාජධානිය තුළ පැවති පහත සමාජ සංවිධානයන් පිළිබඳව කෙටි වාක්‍යයක් බැගින් ලියන්න.

A. ගබඩාගම
B. නින්දගම්
C. විහාරගම්
D. දේවාලගම
E. පරවේනිගම

(ලකුණු 5)

IV. පෘතුගීසින් ආසියාවට පැමිණීම හා ආසියාවේ බලය ස්ථාපිත කර ගැනීම කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

06.

I. දහ අටවන සියවස වන විට මෙරටින් අපනයනය කළ වෙළඳ ද්‍රව්‍ය තුනක් ලියන්න (ලකුණු 3)

II. ත්‍රිකුණාමල වරාය කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

III. 1848 නිදහස් සටනට නායකත්වය දුන් නායකයන් දෙදෙනෙකු නම් කොට එම සටනේ ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. බෞද්ධ පුනරුද ව්‍යාපාරය පිළිබඳව පහත සඳහන් කරුණු යටතේ විස්තර කරන්න.

A. මුද්‍රණාල පිහිටුවීම
B. බෞද්ධ පාසැල් පිහිටුවීම

(ලකුණු 06)

07.

I. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල පැවති ප්‍රධාන ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 3)

II. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 4)

III. තේ වගාවේ උන්නතියට බලපෑ හේතු දෙකක් ලියා කෝපි වගාව අසාර්ථක වීමට බලපෑ එක් හේතුවක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ සිදු වූ සමාජ වෙනස් වීම් තුනක් නම් කොට, පැහැදිලි කරන්න. (ලකුණු 6)



Scanned with CamScanner

## III කොටස

08.

I. පුනරුද සමයේ සිටි විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කළ දාර්ශනිකයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

II. පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

III. පුනරුදය සමයේ වෙනස් වූ කලා ශිල්පයන් දෙකක් නම් කර ඒවායේ වෙනස් වූ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. පුනරුදය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය පහත සඳහන් ලක්ෂණ යටතේ පැහැදිලි කරන්න.

A. දේශපාලන වෙනස්කම්

B. සමාජ සංස්කෘතික වෙනස්කම් (ලකුණු 06)

09.

I. කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ලකුණු 3)

II. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

III. කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ වෙනත් ක්ෂේත්‍ර දෙකක් නම් කර එයින් එක් ක්ෂේත්‍රයක් පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. කාර්මික විප්ලවය මගින් ශ්‍රී ලංකාවේ සමාජ ක්ෂේත්‍රයේ ඇතිවූ වෙනස්කම් තුනක් නම් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06)

------ // ----